**තානාපතිනී ඇලයිනා බී. ටෙප්ලිට්ස්**
**ඇමරිකානු වාණිජ මණ්ඩල සංසදයේ දී පළ කළ අදහස්**
**2019 අගෝස්තු 15**

**තානාපතිනී ටෙප්ලිට්ස්: -** ඉතා විවිධාකාර වූ ආර්ථික අංශ මෙම රැස්වීමේ නියෝජනය වේ. මම ඇත්ත වශයෙන්ම සිතන්නේ අප මෙහිදී දකින්නේ ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගතය බවයි. මෙහිදී කථාවක් පැවැත්වීමට මට ආරාධනය කිරීම ගැන වැඩබලන සභාපති ප්‍රසන්න ජයමහටත්, නුස්රෙත් ජලදීන්ටත් ස්තූති කරමි. වාණිජ මණ්ඩලය සහ තානාපති කාර්යාලය අතර සම්බන්ධතා වැඩි කිරීමට දැරූ උත්සාහය වෙනුවෙන් විශේෂයෙන්ම නුස්රෙත්ට ස්තූතිවන්ත වෙමි. එය දිගටම කරගෙන යෑම අපට අවශ්‍යයි. මම හිතන හැටියට පසුගිය වසර කිහිපය තුළ අපි ඉතා හොඳ හවුල්කාරිත්වයක් ගොඩ නගා ගෙන ඇති අතර, අපට තවත් බොහෝ දේ කළ හැකි බව මම දනිමි.

තානාපති වශයෙන් මගේ මූලික අරමුණු වලින් එකක් වන්නේ ඇත්තෙන්ම ඒ ගැන කථා කිරීමයි. ඇත්ත වශයෙන්ම එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව සඳහා ආර්ථික සමෘද්ධිය පිළිබඳ න්‍යාය පත්‍රයක් ඉදිරියට ගෙන යෑම මගේ එක් ඉලක්කයක් වන බැවින් අපට හොඳ හවුල්කාරිත්වයක් අවශ්‍යයි. විදේශ ආයෝජන සාදරයෙන් පිළිගන්නා මෙන්ම විවෘත, සාධාරණ හා අන්‍යෝන්‍ය ආර්ථික පරිසරයකට සහාය දෙන ශ්‍රී ලාංකික හවුල්කරුවන් ඇමරිකානු ව්‍යාපාර සමග සම්බන්ධ කරන නව ක්‍රම හා නව අවස්ථා ගැන මගේ කණ්ඩායම නිරන්තරයෙන් සොයා බලයි.

ඇත්ත වශයෙන්ම අප එය හඳුන්වන්නේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ලෙසයි. විදේශවල කටයුතු කිරීමේදී එය අපේ එක් මූලික අඩිතාලමක් වේ. ඇත්ත වශයෙන්ම, ද්විපාර්ශ්වික වෙළඳාම ප්‍රවර්ධනය කිරීම පමණක්ම වුවත් ඉතා හොඳ දෙයකි. කිසිවෙකු එයට වෙනස් මතයක් නො දරණ බව මට විශ්වාසයි. එහෙත් ආර්ථික රාජ්‍යතාන්ත්‍රිකභාවය යනු වෙළඳ සංඛ්‍යාලේඛන වැඩි කිරීමට වඩා වැඩි දෙයකි. එයින් අදහස් කරන්නේ අලුත් හා මෙතෙක් සොයා නොගත් වෙළඳපල විවෘත කිරීමයි. එහි අර්ථය වන්නේ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා ඇති අවස්ථා හඳුනා ගැනීමයි. එහි තේරුම කාන්තා ව්‍යවසායකයින් සඳහා අවස්ථා ප්‍රවර්ධනය කිරීමයි. එයින් අදහස් වන්නේ රෙගුලාසි, ගාස්තු, තීරුබදු නොවන බාධක හෝ සංස්කෘතික වරදවා වටහාගැනීම් යනාදියෙන්, වෙළඳාම සහ ආයෝජන සඳහා ඇති ප්‍රධාන බාධාවන්ට ආමන්ත්‍රණය කිරීම තුළින් සෑම දෙනෙකුටම වැඩි අවස්ථා ලබා දීමයි.

මම විශේෂයෙන් ම, මෙයින් අදහස් කරන්නේ ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ සියල්ලන්ටම ප්‍රතිලාභ අත්වන වාතාවරණයක් ඇති කිරීම සඳහා කොළඹ එක්සත් ජනපද තානාපති කාර්යාලයේ සමස්ත කණ්ඩායම යොදා ගැනීමයි. අපගේ නව ආර්ථික ප්‍රධානී සූසාන් වෝක්ද අද රාත්‍රියේ මා සමග මෙහි සිටී. ඔබ බොහෝ දෙනෙකුට ඇය හමුවීමට අවස්ථාවක් ලැබෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි. අපේ මෙම උත්සාහයට නායකත්වය දීමට ඇය සහාය වනු ඇත. අපේ රටවල් දෙකටම වාසි සැලසෙන පරිසරයක් ගොඩ නැගීම අපට අවශ්‍යයි. ඒ සඳහා, අපි ව්‍යාපාරික ප්‍රජාවට ඇහුම්කන් දිය යුතු බවත්, ඔබේ ගැටළු සැලකිල්ලට ගත යුතු බවත්, ක්‍රියාත්මක කළ හැකි විසඳුම් ලබා ගැනීමට ශ්‍රී ලංකා රජය සමඟ කටයුතු කළ යුතු බවත් අපි දනිමු.

ඇමරිකානු ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය යනු හවුල් සමෘද්ධිය සහ අපේ ව්‍යාපාරික කටයුතු කරන ආකාරයෙහි අන්තර්ගත හවුල් වටිනාකම් ය. අපේ අපේක්ෂිත ආර්ථික පරිසරය විස්තර කිරීම සඳහා මීට පෙර මම විවෘත, සාධාරණ හා අන්‍යෝන්‍ය යන වචන භාවිතා කළෙමි. ඔබ බලාපොරොත්තු වන ආර්ථික පරිසරය ද එය යැයි මම සිතන්නේ මේවා සියලු ආර්ථිකයන් සඳහා වැදගත් ගුණාංග යැයි අපි විශ්වාස කරන බැවිනි. ඒ මගින් පාරදෘශ්‍ය හා තරඟකාරී ආර්ථික වර්ධනයක් ලබා දෙයි. ඒවා නම් - විවෘත, සාධාරණ, අන්‍යෝන්‍ය යන ගුණාංගයි. පාරදෘශ්‍ය සහ තරඟකාරී යන නව වචන දෙකත් එයට එක් කිරීමට මට ඉඩ දෙන්න. මේ මගින් අපට පුද්ගලික අංශයේ කටයුතු සඳහා සම බිමක් නිර්මාණය කළ හැකියි. අන්‍යෝන්‍ය වශයෙන් වාසිදායක විධිවිධාන සහ මූල්‍ය අවදානම ඇති කරන ව්‍යාපාරික භාවිතයන්ගෙන් නිදහස්වීම සහතික කිරීම මගින් ඒවා ජාතීන්ගේ ස්වෛරීභාවය ප්‍රවර්ධනය කරයි. මෙම ගුණාංග නව අදහස් ජනනය කිරීමට සහාය වන අතර තරුණ ව්‍යවසායකයින්ට ඔවුන්ගේ හැකියාවන් මුදා හැරීමට මාර්ගයක්ද ලබා දෙයි. ඇමරිකානුවන් මෙම සාරධර්ම කෙරෙහි අවධානය යොමු කරන්නේ පසුගිය වසර 70 තුළ ලෝකයේ දැක ඇති ආර්ථික වර්ධනයට සහ එහි ප්‍රතිඵලයක් ලෙස දරිද්‍රතාවය පිටුදැකීමට ඒවා හේතුවූයේ යැයි අප විශ්වාස කරන බැවිනි.

නිදහසින් පසු ශ්‍රී ලංකාවට එක්සත් ජනපදය ඩොලර් බිලියනයකට වැඩි ප්‍රදානයන් සහ සෘජු සංවර්ධන ආධාර ලබා දී තිබේ. පසුගිය අවුරුදු 70 තුළ ලබා දී ඇති ඩොලර් බිලියනය ආධාර පමණක් වන අතර එයින් එක ඩොලරයක්වත් ණයක් ලෙස ලබා දී නැත. තවද අපගේ රටවල් දෙකේම දිගුකාලීන වර්ධනය සහ හවුල් සමෘද්ධිය ගොඩ නැගීම සඳහා අපි දිගටම කටයුතු කරන්නෙමු. කුටුම්භ 10,000 කට අධික සංඛ්‍යාවක් එක්සත් ජනපද රජයේ ආධාරයෙන් සෘජුවම ප්‍රතිලාභ ලබන අතර, මෙම කුටුම්භයන්ගේ දළ ආදායම දැන් ඩොලර් මිලියන 10.7 ඉක්මවා තිබේ. ඒ අපේ මෑත කාලීන සමහර ව්‍යාපෘතිවලින් පමණි. අපේ ආධාරයෙන් ක්ෂුද්‍ර ව්‍යවසායන් 5,000 කට වැඩි ප්‍රමාණයක් ප්‍රතිලාභ ලබා ඇති අතර, ආයෝජන ප්‍රදානයන් ලැබූ අය විසින් වාර්තා කර ඇති ඒවායේ සමස්ත විකුණුම් ආදායම ඩොලර් මිලියන 68 ක් පමණ වේ. ඒවා ද පසුගිය අවුරුදු කීපය තුළ ක්‍රියාත්මක කළ ව්‍යාපෘතිවලින් මිස අවුරුදු 70ක් පුරා ලබා දුන් ආධාර වලින් නොවේ.

වැදගත්ම දෙය නම්, කාන්තා ශ්‍රම බලකායේ සහභාගීත්වය අවශ්‍ය රටක - සෑම කෙනෙකුගේම ආර්ථික වර්ධනය සහ ආර්ථිකයේ විභවය වැඩි කිරීම සඳහා මෙම සහභාගීත්වය අවශ්‍ය වේ. එක්සත් ජනපද රජය ආධාර කළ වැඩසටහන්වල සමස්ත කාන්තා සහභාගීත්වය සියයට 26 ක් ලෙස වාර්තා වී තිබේ. මෙම ප්‍රතිඵල නැවත නැවතත් ලබා ගත හැකි වේ යැයි අපි බලාපොරොත්තු වෙමු.

ඔබ උනන්දුවක් දැක්විය හැකි වැඩසටහන් තුනක් ඉස්මතු කිරීමට මට අවශ්‍යයි. ඒ මන්ද ඒවා ආර්ථික වර්ධනයට සෘජුවම සහාය වන්නේ යැයි මා සිතන බැවිනි. සමහර අවස්ථාවල මෙම වැඩසටහන් සම්බන්ධයෙන් මාධ්‍ය මගින් වැරදි තොරතුරු හෝ සාවද්‍ය තොරතුරු ලබා දී ඇත. ඇත්ත වශයෙන්ම, අපේ මාධ්‍ය ක්ෂේත්‍රයේ අමුත්තන් මෙහි පැමිණ සිටියද, ඔබට සත්‍ය කරුණු ලැබෙන බව සහතික කර ගැනීමට මට අවශ්‍යයි. මෙම වැඩසටහන් මා කතා කරමින් සිටි ආකාරයේ වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා අපේ රජයේ ප්‍රවේශය - එක්සත් ජනපද රජයේ ප්‍රවේශය - පෙන්නුම් කරයි: එනම් නිදහස්,

සාධාරණ, විවෘත, අන්‍යෝන්‍ය සහ පාරදෘශ්‍ය වර්ධනයකි. ආර්ථික වර්ධනය, පෞද්ගලික අංශය සමඟ සහයෝගයෙන් කළ යුතු බවට අපේ විශ්වාසය ද මෙම වැඩසටහන් මගින් පෙන්නුම් කරයි.

යූලීඩ් (You Lead) මෙම වැඩසටහන් වලින් එකකි. පාස්කු ප්‍රහාරයෙන් පසු සංචාරක කර්මාන්තය ඉක්මණින් යථා තත්ත්වයට පත් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සන්ධානය ඇතුළු පෞද්ගලික අංශයේ හවුල්කරුවන් ගණනාවක් සමඟ අපගේ (USAID) සගයන් වැඩ කර තිබේ. ශ්‍රී ලංකාවේ ව්‍යවසායකත්ව විෂයමාලාව සංශෝධනය කිරීමට මෙම (You Lead) සංවිධානය සහාය වන අතර තරුණ ව්‍යවසායකයින් දිරිගැන්වීම සඳහා වෘත්තීය හා කාර්මික අධ්‍යාපනඥයින්ට නව මෙවලම් සපයයි. සමහරවිට මේ කාමරයේ සිටින සමහර අය සමගත් අපි වැඩ කර තිබෙන්නට පුළුවන.

බිස් + (Biz +) යනු ශ්‍රී ලංකාව පුරා විවිධ අංශයන්හි කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ව්‍යාපාර 60 කට වැඩි සංඛ්‍යාවක් සමඟ හවුල් වී ඇති තවත් වැඩසටහනක් වන අතර එහි ප්‍රතිඵල විශ්මය ජනක බව කිව යුතුයි. මෙම (Biz +) වැඩසටහන යටතේ යටිතල පහසුකම් සංවර්ධනය, කාන්තාවන් සවිබල ගැන්වීම, ග්‍රාමීය ආර්ථිකයේ කුඩා ව්‍යාපාර හිමියන්ට උපකාර කිරීම, නිෂ්පාදන පරිමාව වැඩි කිරීම සහ වැඩිදියුණු කිරීම, ලාභදායීතාව වැඩි කිරීම, සේවා ස්ථාන සම්බන්ධීකරණය වැඩි දියුණු කිරීම සහ - ශ්‍රී ලංකාවේ ව්‍යාපාරික තරඟකාරිත්වය සඳහා තීරණාත්මක වන - මූල්‍ය හා කළමනාකරණ භාවිතයන් සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන් යොදා ගැනීමට සහාය වීම ආදි විවිධ කටයුතු සිදු කර තිබේ.

බිස් +(Biz +) සහාය දක්වන ව්‍යාපාර, පුද්ගලික ප්‍රාග්ධනයෙන් ඩොලර් මිලියන 22 ක් ලබා ගෙන තිබේ. ඔවුන් රැකියා 8,000 කට වැඩි ප්‍රමාණයක් නිර්මාණය කර ඇති අතර ව්‍යාපාර ආයෝජන, රැකියා සහ ආදායම් වර්ධනයෙන් ඩොලර් මිලියන 25 ක් පමණ ආර්ථික බලපෑමක් කර තිබේ. මේවා සැලකිය යුතු ප්‍රතිඵල වේ. මෙය ස්ථාවර, විශ්වාසදායක ආදායමක් සහිත පවුල් 8,000 කට පරිවර්තනය වන අතර එය තානාපති කාර්යාලයේ මට සහ මගේ කණ්ඩායමේ සැබෑ ආඩම්බරයට හේතු වේ.

අවසාන වශයෙන්, මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සංවර්ධන ආධාර ප්‍රදානය ගැන කතා කිරීමට මට ඉඩ දෙන්න. ඔබ නිසැකවම මේ ගැන මාධ්‍යයෙන් අසා ඇති. මෙම ආධාර වැඩසටහන සැබවින්ම කුමක් ද යන්න පැහැදිලි කිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ආයතනය කටයුතු කර තිබේ. මම ඔබට තවත් විස්තර කියන්නම්.

මෙම වැඩසටහන සකස් කිරීම සඳහා පසුගිය දෙවසර තුළ අපි, එනම් ශ්‍රී ලංකා රජය සහ එක්සත් ජනපද රජය. ඉතා සහයෝගයෙන් වැඩ කළෙමු. ආර්ථික වර්ධනය උත්ප්‍රේරණය කිරීම මෙහි අරමුණයි. මෙම යෝජිත, පස් අවුරුදු වැඩසටහනේ කොටසක් වන ව්‍යාපෘති හඳුනා ගැනීම සඳහා පැවැත්වූ සමහර වැඩමුළු සහ යොමු කණ්ඩායම්වලට ඔබෙන් සමහරෙකු සහභාගී වී ඇති. මේ සඳහා ඩොලර් මිලියන 480 ක ප්‍රදානයක් ලබා දෙනු ඇත. එය එක්සත් ජනපදයේ ජනතාවගෙන් ශ්‍රී ලංකාවේ ජනතාවට ලබා දෙන බිලියන භාගයක පමණ ආධාරයකි. මෙය ණයක් නොවේ. මෙම වැඩසටහනේ ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකාවේ ශේෂ පත්‍රයට එක රුපියලකවත් ණයක් එකතු නොවේ.

මෙම වැඩසටහනෙන් ඉටු වන්නේ කුමක් ද? එහි - ප්‍රවාහන යටිතල පහසුකම් සහ ඉඩම් පරිපාලනය - යනුවෙන් සංරචක දෙකක් තිබේ. මේ දෙකම තෝරාගනු ලැබුවේ ඒවා ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයට සැලකිය යුතු ලෙස බාධා කරන බව හඳුනාගෙන ඇති බැවිනි. ව්‍යාපාරවල යෙදී සිටින ඔබ බොහෝ දෙනෙක් මෙම අංශයන්හි ඇති ප්‍රධාන අභියෝග පිළිබඳව දැනුවත් අතර, ඒවා වැඩසටහනේ ප්‍රධාන අංග ලෙස හඳුනාගෙන ඇත්තේ ඒ නිසාය.

ඉතින්, මෙම අංශවල කුමක් සිදුවේද? අපි ප්‍රවාහනයෙන් පටන් ගනිමු. මෙම සංවර්ධන ගිවිසුම මගින් මහ කොළඹ ප්‍රදේශයේ කිලෝමීටර් 205 කට වැඩි ප්‍රමාණයක මහාමාර්ග වැඩිදියුණු කිරීම සඳහා අරමුදල් සපයනු ඇත. මෙම මාර්ගවල දිනකට මිලියන දෙකක ජනතාවක් ගමන් කරයි. එමගින් උච්ච වේලාවන්හිදී රථවාහන තදබදය සැලකිය යුතු ලෙස අඩු කරනු ඇත. ජනගහනයෙන් අඩක් රැකියාවට යාමට යොදා ගන්නා බස් සේවා වැඩි දියුණු කිරීම මෙයට ඇතුළත් වේ. එමෙන්ම උසස් ගමනාගමන කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම මෙම වැඩසටහනේ ප්‍රධාන අංගයක් වේ.

දිවයිනේ දුප්පත්ම කලාපයන් වන මධ්‍යම, සබරගමුව සහ ඌව පළාත්වල, පළාත් මාර්ග වැඩිදියුණු කිරීම සඳහා ද මෙම ගිවිසුම මගින් අරමුදල් සපයනු ඇත. නමුත් මෙම කලාප ඉතා ඵලදායී වේ. ඔවුන් නිෂ්පාදනය කරන්නේ තේ, රබර්, පලතුරු සහ එළවළු ය. වෙනත් වචන වලින් කිවහොත්, විශේෂයෙන් කුඩා ව්‍යවසායකයින්ට තම භාණ්ඩ වෙළඳපොළට ගෙන ඒමට අවශ්‍ය වන්නේ මෙම ස්ථානවල සිටයි. ඔවුන්ගේ ව්‍යාපාරවලට සහාය වීම සඳහා ඔවුන්ට විශ්වාසදායක මාර්ග ජාලයක් සහ වරායන් සහ කොළඹ වෙළඳපල වෙත භාණ්ඩ පහසුවෙන් ප්‍රවාහනය කළ හැකි ජාලයක් අවශ්‍ය වේ.

ඉඩම් පරිපාලන අංශය සම්බන්ධයෙන්, මෙම ප්‍රදානයෙන් ශ්‍රී ලංකා රජයේ දැනට පවත්නා වැඩසටහන් සඳහා අරමුදල් සපයනු ඇත. මේ අතර රජයේ ඉඩම් ලේඛනගත කිරීම හා සිතියම් ගත කිරීම වැඩිදියුණු කිරීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ශ්‍රී ලංකා පුරවැසියන්ට ඔවුන්ගේ ඔප්පු ඩිජිටල් ආකාරයකට පරිවර්තනය කිරීමෙන් ඔවුන්ගේ ඉඩමට වැඩි හිමිකමක් ලබා ගැනීමට උපකාරී වන වැඩසටහන්ද වේ. ඩිජිටල් ආකාරයකට පරිවර්තනය කිරීම නිසා ඔවුන්ගේ ලේඛන නැතිවීමෙන්, හානි වීමෙන් හෝ සොරකම් කිරීමෙන් ආරක්ෂා වෙයි. මේවා රජයේ දැනට පවතින වැඩසටහන් බව අවධාරණය කිරීමට මට අවශ්‍යයි. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සංවර්ධන ආධාර වැඩසටහන යටතේ නව වැඩසටහන් කිසිවක් ක්‍රියාත්මක නොකෙරේ. මෙහිදී සිදු වන්නේ ශ්‍රී ලංකා රජය ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්පූර්ණ කිරීම සඳහා අරමුදල් සපයමින් සහාය වීමයි. මම මෙය අවධාරණය කරන්නේ මෙම වැඩසටහන පිළිබඳව විශේෂයෙන් පොදු අවකාශයේ ඉතා නරක හා අසත්‍ය තොරතුරු පැතිරී ඇති බැවිනි. මට ඇත්තටම තවත් කරුණු කිහිපයක් පැහැදිලි කිරීමට අවශ්‍යයි. මම හිතනවා ඔබ මට තව මිනිත්තුවක් ඉඩ දේවි කියා.

ශ්‍රී ලංකා රජයේ ප්‍රමුඛතා සහ ආර්ථික වර්ධනයට ඇති බාධක විශ්ලේෂණය කරන අධ්‍යයනවලට ප්‍රතිචාර වශයෙන් මෙම වැඩසටහන සැලසුම් කර ඇත්තේ ප්‍රවාහන යටිතල ව්‍යුහයේ ප්‍රධාන කොටස් ආමන්ත්‍රණය කිරීමට සහ රජයේ සැලසුම් කළ ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමට යි. මෙය, රජය, පෞද්ගලික අංශය, සිවිල් සමාජය හා විද්වතුන් සමඟ පුළුල්ව සාකච්ඡා කිරීමෙන් සකස් කරන ලද හා

වර්ධනය වන ප්‍රධාන අංශ මේවා බව ඉස්මතු කරන ලද අධ්‍යයන හා ආර්ථික විශ්ලේෂණ මත පදනම්වූ වැඩසටහනකි.

මෙම ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් අපේක්ෂිත ව්‍යාපෘතියේ සියලු අංශ අධීක්ෂණය හා පාලනය රඳවා ගනු ඇත. වැඩිදියුණු කරණ සියලුම මාර්ග, වැඩිදියුණු කරන සෑම මාර්ග සංඥාවක් සහ බස් ජාලයක්ම, ඉඩම් වාර්තා ඩිජිටල්කරණය කිරීමට සහ නිවැරදි ඉඩම් මැනුම් පිළියෙල කිරීමට දරන උත්සාහයේ සෑම අංශයක්ම ආදී සියලු කරුණු ශ්‍රී ලංකා රජයේ තීරණ මත ක්‍රියාත්මක වනු ඇත. මෙම ගිවිසුම යටතේ එක්සත් ජනපදයට කිසිදු ඉඩමක් අයිති නොවනු ඇත. එසේම පාලනය හෝ පරිපාලනය නොකරනු ඇත.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) ගිවිසුමට වසර 5 ක ස්ථාවර ක්‍රියාත්මක කාල සීමාවක් තිබේ. එබැවින් අපි ගිවිසුම් ගත වන්නේ සීමිත කාල රාමුවක් ඇති වැඩසටහනක් සඳහායි. ක්‍රියාත්මක කිරීමේ කාලය වසර පහකි. සෑම දෙයක්ම සූදානම් කර ගැනීම සඳහා ඉදිරිපස කෙළවරේ තවත් මාස 18 සිට අවුරුදු දෙකක් දක්වා වූ කාලයක් වෙන් කර ඇත. ඒ කාලය තුළ අවසාන ශක්‍යතා අධ්‍යයනයන් සහ අනිකුත් සියලු කටයුතු නිමා කර ගැනීමෙන් නියමිත පස් අවුරුදු කාලය තුළ වැඩසටහන් නියමිත වේලාවට අවසන් කළ හැකි වේ. ඇත්ත වශයෙන්ම මෙම කටයුතු වෙනුවෙන් අවුරුදු පහක් වැනි කෙටි කාලයක් තුළ ඩොලර් මිලියන 480 ක් වියදම් කිරීම පහසු නොවන බව ඔබ ද පිළිගන්නා බව මට විශ්වාසයි. වේගවත් ලෙස වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා අපට සූදානම් වීමට අවශ්‍ය නිසා ව්‍යාපෘතියේ මුළු ආයු කාලය අවුරුදු හතකට වඩා වැඩි නොවේ. මෙය කල් පවත්නා ගිවිසුමක් නොවේ. එය එක් වරක් පමණක් ක්‍රියාත්මක වන වැඩසටහනකි.

මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) වැඩසටහනේ තවත් අංගයක් වන්නේ පුද්ගලික අංශය සමඟ විනිවිද පෙනෙන හවුල්කාරිත්වයක් ගොඩ නගා ගැනීමයි. මෙම (MCC) ආයතනයේ වෙබ් අඩවියෙන් ඔබට ලබා ගත හැකි ප්‍රසම්පාදනය, හවුල්කාරිත්වය සහ ආයෝජන අවස්ථා පිළිබඳව සොයා බලන ලෙස මම ඔබ සැමගෙන් ඉල්ලා සිටිමි. එය (MCC) වෙබ් අඩවියේ ඇති 'අප සමඟ වැඩ කරන්න' පිටුව යටතේ දැකිය හැකි අතර MCC.gov යන වෙබ් ලිපිනයෙන් එයට ඉතා පහසුවෙන් ප්‍රවේශ විය හැකියි. අපි සොයන්නේ අපට වැඩ කළ හැකි හවුල්කරුවන් වන අතර ඇත්ත වශයෙන්ම මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) යනු පුද්ගලික අංශයට කන් දෙන සංවර්ධන ප්‍රවේශයක් අනුගමනය කරන ආයතනයකි.

ඔබට මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) පිළිබඳ සුළු හැඳින්වීමක් ලබා දීමට මට අවශ්‍යයි. මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් යනු එක්සත් ජනපද රජයේ සංවර්ධන ආධාර ආයතනයකි. එය ඔබ සමහර දෙනෙකුට වඩාත් හුරුපුරුදු අන්තර්ජාතික සංවර්ධනය සඳහාවූ එක්සත් ජනපද ආයතනයේ (USAID) සහෝදර ආයතනයකි. එයට සංවර්ධන ආධාර සම්බන්ධයෙන් ඉතා සුවිශේෂී හා කාලානුරූපී ප්‍රවේශයක් ඇත. මෙම (MCC) ආයතනය හරහා අපි 2004 වර්ෂයේ සිට ලොව පුරා රටවල් 29 ක සම්මුති හෝ ගිවිසුම් 37 ක් සඳහා ඩොලර් බිලියන 14 ක් ආයෝජනය කර ඇත්තෙමු. මෙය ආර්ථික

වර්ධනයට ඇති බාධක ඉවත් කිරීමට හා දුප්පත්කමින් මිදීමට මිනිසුන්ට උපකාර කිරීම සඳහා එක්සත් ජනපදය ලොව පුරා වියදම් කර ඇති සැලකිය යුතු සංවර්ධන ආධාර ප්‍රමාණයක් වේ.

වෙනත් ස්ථානවල ක්‍රියාත්මක කර ඇති සම්මුති වර්ග පිළිබඳ උදාහරණ කිහිපයක් ඔබට ඉදිරිපත් කිරීමට මට ඉඩ දෙන්න. උදාහරණයක් ලෙස ජෝර්ජියා රටේ විද්‍යාව, තාක්‍ෂණය සහ ඉංජිනේරු විද්‍යාව සහ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ජාත්‍යන්තරව පිළිගත් උපාධි ගණන වැඩි කිරීමට එක්සත් ජනපද රජය කටයුතු කරයි. මෙය, ව්‍යාපෘති සඳහා මෙහි යෝජනා කර ඇති ක්‍රමයට වඩා බෙහෙවින් වෙනස් විධිවිධානයකි. අප ගිවිසුමක් ඇති තවත් රටක් වන සෙනෙගල්හි ඔවුන්ට අවශ්‍ය වූයේ විශ්වාසනීය විදුලිය සඳහා වන ඉල්ලුම සපුරාලීම සඳහා විදුලිබල අංශය ශක්තිමත් කිරීමටයි. මම මීට පෙර එක්සත් ජනපද තානාපතිවරයකු ලෙස සිටි නේපාලයේ දකුණු ආසියාවේ පළමු මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සම්මුතියට අත්සන් කිරීමේ ගෞරවය මට හිමි විය. බලශක්ති සම්ප්‍රේෂණ කොරිඩෝර තැනීමෙන් අඩු බලශක්ති සැපයුම සහ ඉහළ බලශක්ති ප්‍රවාහන වියදම් පිළිබඳ ගැටළුව විසඳීමට එම අරමුදල් උපකාරී වේ.

මෙම සම්මුතීන් සියල්ලම ක්‍රියාත්මක කරන රටවලට ඒ මගින් අවශ්‍ය දේ ලබා දෙන බව අපි විශ්වාස කරමු. ඒවා සෑම තැනකම වර්ධනයට උපකාර කරමින් ගෝලීය වශයෙන් ලබා දේ. දැනට සම්පූර්ණ කරන ලද සම්මුති 24 සමග - සම්මුතිය යනු ගිවිසුමට තවත් වචනයක් පමණි - ගෝලීය වශයෙන් මිලියන සංඛ්‍යාත ජනතාවක් මෙවැනි ව්‍යාපෘති තුළින් ඉදි කරන ලද හෝ දියුණු කරන ලද මාර්ග හරහා දැන් කිලෝමීටර් 3,480 කට වඩා වැඩි මාර්ග ප්‍රමාණයක ගමන් කරන අතර ඒවා ව්‍යාපාර, වෙළඳපොළට සම්බන්ධ කරමින් දේශීය හා ජාත්‍යන්තර වෙළඳාමට රුකුල් දෙයි.

මීට අමතරව, කුටුම්භ, ව්‍යාපාර සහ ප්‍රජා සංවිධාන 300,000 කට වැඩි සංඛ්‍යාවකට දැන් ඔවුන්ගේ ඉඩම් සඳහා නීතිමය අයිතිවාසිකම් ඇත. මෙය විශේෂයෙන් කාන්තා ගෘහ මූලිකයන් සවිබල ගැන්වීමකි. ඒ මගින් පුද්ගලයන්ගේ ණය ලබා ගැනීමේ හැකියාව වැඩි කර ඇති අතර ඉඩම් සම්බන්ධ ගැටුම් අවම කර ඇත. ඒ හා සමාන ප්‍රතිඵල ශ්‍රී ලංකාවේ මිලේනියම් චැලෙන්ජ් කෝපරේෂන් (MCC) සංවර්ධන වැඩසටහනින් ද ලබා ගත හැකි බව මට විශ්වාසයි . මෙය සීමිත කාල සීමාවක් සහිත ප්‍රදානයක් වන නමුත් ඉතා අභිලාෂකාමී අදහස් අඩංගු ව්‍යාපෘතියකි.

කෙසේ වෙතත්, ශ්‍රී ලංකාවේ අනාගතය සඳහා ආයෝජනය කරන එකම ආයතනය එක්සත් ජනපද රජය නොවේ. ඔබ බොහෝ දෙනෙක් මෙහි පැමිණීමට හේතුව පිළිබඳ මගේ ප්‍රකාශ නැවත ඉදිරිපත් කිරීමට මට අවශ්‍යයි. එක්සත් ජනපද සමාගම් ශ්‍රී ලංකාවේ ඩොලර් මිලියන 300 කට අධික මුදලක් ආයෝජනය කර ඇති අතර, නිෂ්පාදන කටයුතුවල සිට තොරතුරු තාක්ෂණ ව්‍යාපාර සේවා දක්වා සහ ඒ අතර ඇති සෑම දෙයක්ම පාහේ ඇතුළත් වන කර්මාන්තවල ඉහළ මට්ටමේ, උසස් තත්ත්වයේ රැකියා සිය ගණනක් උත්පාදනය කර තිබේ. මා කී පරිදි ඔබ සෑම ශ්‍රී ලංකා ආර්ථිකයේ අනාගතයයි.

විශේෂයෙන් එක්සත් ජනපද සමාගම්වලට මෙන්ම වෙනත් රටවල සමාගම් වලටද චීනයේ ඔවුන්ගේ ආයෝජන අවදානමට ලක් වීමට ඉඩ ඇති හෙයින්, වෙනත් තැන්වල ආයෝජනය කිරීමේ ප්‍රවනතාවක් මට පෙනේ. ශ්‍රී ලංකාවට විශේෂයෙන්ම ලුහු නිෂ්පාදන අංශයෙන් මෙම ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීමට වැඩි හැකියාවක් තිබේ.

ඇමරිකානු ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික පිළිවෙත්වල වැදගත් අංගයක් වන්නේ ව්‍යාපාරික පරිසරය වැඩිදියුණු කළ හැකි නිශ්චිත වෙනස්කම් සඳහා පෙනී සිටීමයි. එනම් විවෘත, සාධාරණ, වඩා පාරදෘශ්‍ය සහ වඩා තරඟකාරී ආර්ථිකයක් සඳහා වන වෙනස්කම් වෙනුවෙන් පෙනී සිටීමයි. ඔබ සහ අනිකුත් ව්‍යාපාරික නායකයින්ගේ ප්‍රතිපෝෂණ මත පදනම්ව, මගේ කණ්ඩායම සහ මම තීරණාත්මක නීති ප්‍රතිසංස්කරණ සහ නවීකරණය සඳහා මෙන්ම පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර නියාමන පරිසරයක් සඳහා දිගටම පෙනී සිටිමි.

නිදසුනක් වශයෙන්, එක්සත් ජනපද ව්‍යාපාර සඳහා තරඟ කිරීමට කැමති සහ ඩිජිටල් ආර්ථිකයෙන් ප්‍රයෝජන ගැනීමට අපේක්ෂා කරන ඕනෑම රටක ශක්තිමත් ආකාරයට බුද්ධිමය දේපල අයිතිවාසිකම් ආරක්ෂා කිරීම වඩ වඩාත් වැදගත් වී තිබේ. මෙම මූලික අයිතිය නොමැතිව නවෝත්පාදනයන් සඳහා කිසිදු දිරිගැන්වීමක් නොමැත. මන්ද යත් එවිට නවෝත්පාදනයෙන් කිසිම ප්‍රතිලාභයක් නො ලැබෙන බැවිනි.

පුරෝකථනය කළ හැකි සහ ස්ථාවර නියාමනයක් සම්බන්ධයෙන්, සැපයුම්කරුවන්, ගනුදෙනුකරුවන් සහ සේවකයින් අතර බලාත්මක කළ හැකි අයිතිවාසිකම් සහ පොදු අවබෝධය ඇති කරන නීතිවලට අපි දිගටම සහාය දෙමු. වෙනත් පාර්ශවකරුවන් අතර පෞද්ගලික අංශයෙන් ලැබෙන අදහස්ද සැලකිල්ලට ගනිමින් රීති සකස් කළ යුතුය. එබැවින් ව්‍යාපාරවල හඬට ඇහුම්කන් දීමට අපි දිගටම රජය දිරිමත් කරමු.

ව්‍යාපාර කටයුතු නිවැරදිව කිරීම ඇමරිකානු සන්නාමයේ කොටසක් බව මම ආඩම්බරයෙන් ප්‍රකාශ කරමි. එය ඇමරිකානු ව්‍යාපාර සමඟ ව්‍යාපාර කිරීමේ වටිනා යෝජනාවට දායක වන අතර එය ශ්‍රී ලංකාවේ ජනතාවට අගය කළ හැකි දෙයක් යැයි මම විශ්වාස කරමි. ඇමරිකානු වාණිජ මණ්ඩල (AmCham) සාමාජිකයින් කිහිප දෙනෙකු පසුගිය සඳුදා හමුවූ අවස්ථාවේ වැඩබලන සහකාර රාජ්‍ය ලේකම් ඇලිස් වෙල්ස්, පුද්ගලික හවුල්කාරිත්වය තුළින් සමාජ හා ආර්ථික ප්‍රතිලාභ උපරිම කර ගැනීම අතින් එක්සත් ජනපද ව්‍යාපාර ඉදිරියෙන් සිටින ආකාරය ගැන කතා කළාය.

අපගේ සමාගම් ලොව පුරා වගකිවයුතු ව්‍යාපාරික හැසිරීම් සඳහා ආදර්ශයක් වී ඇති නිසා එය මෙහි දී පුනරාවර්තනය කිරීම වටී යැයි මම සිතමි. එය ඇමරිකානු සන්නාමයේ කොටසකි. විවෘත, සාධාරණ, අන්‍යෝන්‍ය සහ පාරදෘශ්‍ය ආර්ථිකයන්, ජීවිත වැඩිදියුණු කරන අතර ප්‍රමිතීන්ද ඉහළ නංවන බව අප දන්නා හෙයින් එක්සත් ජනපදය, ආර්ථික රාජ්‍ය තාන්ත්‍රික කටයුතු තුළින් ලොව පුරා ආර්ථික අවස්ථා පුළුල් කිරීමට ක්‍රියා කරයි.

ශක්තිමත්, ස්වෛරී සහ දක්ෂ ජාතීන් එකට හවුල් වන විට ලෝකය ආරක්ෂිත හා සුරක්ෂිත ස්ථානයක් වන බැවින් අපි ශ්‍රී ලංකාව සමඟ දීර්ඝ හා ඵලදායී හවුල්කාරිත්වයක් අපේක්ෂා කරමු. පසුගිය අවුරුදු 70 ක ද්විපාර්ශ්වික සබඳතා මත ගොඩ නඟන ප්‍රමිතීන් ඉහළ නංවන, ආයෝජන ආකර්ෂණය කර ගන්නා සහ සෑම දෙනාටම අවස්ථා උදා කරන විවෘත, සාධාරණ, අන්‍යෝන්‍ය සහ පාරදෘශ්‍ය ආර්ථිකයක් සහිත අනාගතයක් අපේක්ෂා කරමු.

ඔබ සැමට ස්තූතියි.